# 80 විය සපුරණ අපේ ගුරුමාතාව - සුභද්‍රා

# A TRIBUTE TO AN OUTSTANDING SRILANKAN LADY



**ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන මහත්මිය**
**Dr Mrs Subhadra Siriwardena**
**( Photo- Wilfred Perera)**

ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන මහත්මියට මේ 2008 දෙසැම්බර් මැද අසූවිය සම්පූර්ණ වේ. සිරිවර්ධන මහත්මිය එක්සත් රාජධානියේ සහ ශ්‍රීලංකාවේ වෙසෙන බොහෝ දෙන නමින් හෝ දන්නා බව අපි දනිමු. මෙම ලංකාවිත්ති පුවත් පත කියවන පාඨකයින් ඇය ගැන නිසැකවම දන්නේ මේ පත්‍රය පළවූ මුල් කලාපයේ සිටම මේ වර්තමාන කලාපය දක්වා අවුරුදු 11 ක් පසුවන තුරා අඛණ්ඩව ආචාර්‍ය සිරිවර්ධන මහත්මියගේ සිංහළ පාඩමක් පළවන බැවිනි. මම අපේ පාඨක පිරිසත් සමග මෙම විශිෂ්ට කාන්තාවට සුබ උපන්දිනයක් ප්‍රාර්ථනා කරන්නෙමි.

සුභද්‍රා සිරිවර්ධන මහත්මිය අප ආදරයෙන් හඳුන්වන්නේ අක්කා යන නමිනි. සමහරු ඇයට සිරි අක්කායයිද කියති. සබැවින්ම ඇය අපට අපේම අක්කා කෙනෙකි. දැනුම තේරුම අතින්, ඉගෙනුම අතින්, ගුරුවෘත්තිය අතින්, දයාව කරුණාව හා ආගන්තුක සත්කාර අතින්, දේශප්‍රේමය අතින්, චාම්කම අතින්, හැදුණු වැඩුණු සංස්කෘතිකකම අතින්, මේ ආදී හැම අංශයකින්ම ඇය විශිෂ්ඨ බව කටපුරා කිව හැකිය.

ගුරුවරියක්, ප්‍රධානාචාර්‍යවරියක්, යහපත් බිරිඳක්, ආදරණීය මවක් හා මිත්තණියක් ආදී වශයෙන් අවස්ථා ගණනාවකින් ඇය හැඳින් විය හැකිය. ශ්‍රීලංකාවේත් මේ ලන්ඩන් නගරයේත් පාසැල් ගණනාවක සිරිවර්ධන මහත්මිය ප්‍රධානාචාර්‍ය වරියක් ලෙස කටයුතු කර ඇත. ඇයගේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අද ලොව පුරා සිටිති.

මේ ලංකා විත්ති පුවත්පතට සිරිවර්ධන මහත්මිය සපයන සිංහළ පාඩම බෙහෝ දෙනා කපා එකතුකරන බව අපි දනිමු. එම පාඩම දෙවිදියකින් ප්‍රයෝජනවත් වේ. සිංහළ නොදන්නා අයට සිංහළ ඉගෙන ගන්නටද, ඉංග්‍රීසි නොදන්නා අයට ඉංග්‍රීසි ඉගෙන ගන්නටද එම පාඩම් ප්‍රයෝජනවත් වෙයි.

සිරිවර්ධන මහත්මියගේ ආදරණීය සැමියා ලන්ඩනයේ අප කවුරුත් පාහේ හැඳින්වූයේ සිරි අයියා නම් ආදර නමිනි. සිරි අයියාද මේ මොහොතේ මතක යට නැගෙන්නේ එතුමන්ද සුවිශේෂ ගුණාංගයන්ගෙන් හෙබි විනෝද ජනක, ඇසුරට ප්‍රිය ජනක පුද්ගලයෙකු වූ බැවිනි. සිරි අයියාගේ වියෝගය ගැන අපි තවම දුක්-වන්නෙමු. ඔහු ලංකාවේ බොහෝ දෙනා නොදන්නා පැරණි කරුණු දැන සිටියේය. සැබෑ හිතවතෙක් විය

සුභද්‍රා සිරිවර්දන මහත්මිය ගේ ජීවිත කතාව පොතක් ලියන්නට තරම් අගනා සිද්ධීන්ගෙන් අනූනය. මෙවැනි කෙටි ලිපියකින් ඒ සියල්ල කිව නොහැකිය. ඇයට හොඳ දරුවන් පිරිසක්ද නෑදැයින් රැසක්ද සිටිති. සිරි අක්කා නිතර කියන්නේ තමා ජීවිතයේ ලැබුණු හැම දෙයකින්ම තෘප්තිමත්වන බවත් කණගාටුවන්නට කිසි දෙයක් නැති බවත්ය.

ආචාර්‍ය සුභද්‍රා සිරිවර්ධන මහත්මියට අප්‍රමාණ නිරෝගී සුවසෙතද දීර්ඝායුෂද ප්‍රාර්ථනා කරමි.

*දයා ආනන්ද*

Dr.Subadra Siriwardena a patriotic Sri Lankan lady in our community here reaches eighty years of age this month.An outstanding mother,grand-mother,teacher and a patriotic elder, she is one of the well known and popular figures in our community here for close to four decades.

Born in Bope,Galle in 1928,she grew up in a village in Agalawatte, her fathers native place.This rural upbringing and the early schooling at the village school, she recollects as having made a lasting impression in her life.Her parents were, Mr. Sumana Sooriyagoda one of the pioneer lecturers in Oriental Studies at the University College,Colombo and mother Mrs.Engalthina Samarasinghe Dissanayake A lady from a prominent family in Matara.

At the age of eight years she was bordered at St.John's College, Panadura where she started her education in the English medium. On the early demise of her father and the mother marrying again, the family moved to Nawalapitiya where her step father worked.She continued her education at Anuruddha College, Nawalapitiya a prominent Buddhist Educational Institution.Here, she completed her secondary education passing brilliantly in 1945, the Senior School Certificate(S.S.C.) the equivalent of G.C.E.(O.L.) today.

In 1946 she entered Ananda College, Colombo for her sixth form studies and passed the Higher School Certificate (H.S.C.) as the advanced level was known then.This was also the entry qualification for the University of Ceylon which had been newly established and was still at Reid Avenue,Colombo.She read Sinhala and History for the B.A. Degree and qualified in 1952. She gratefully recollects the guardianship and guidance for all these studies given by Mr.Dharmapala Gammanpila, her step-father and for her future progress.

Career opportunities for educated ladies were limited at that time.The best career for a lady was teaching and just after graduating she started as a teacher at Mahamaya Girls School in Kandy, a well known Buddhist institution .She continued there until 1955 and having decided on a career in Education, entered the University of Ceylon again to follow a course for the Post Graduate Diploma in Education at the Department of Education there of which Prof.T.L.Green was the Head.After completing this course in 1956 Subadra taught for a short period at Kadugannawa Senior School.

Continuing her studies in Education she enrolled for a Masters in Education at the Department of Education which by then had moved to the University of Ceylon at Peradeniya.In 1960 she completed the M.A. in Education with her research thesis in Educational Sociology entitled 'Growing up in a Kandyan Village', a 'Growing up Study' in the lines of the Educational Sociologist Margaret Mead.

In 1960 a big step forward in Education in the country was the take-over of schools run by various religious and other organisations referred to as Assisted Schools which the state



**තරුණවියේදී**
**As a young graduate**

was funding anyway,in order to establish a state system of education.Subadra was asked to go as the Principal of St.Joseph's Balika Vidyalaya, a prominent Christian Girls School in Gampola which had been taken into the State System.She took up the challenge and went as the pioneer principal of St.Joseph's Baljka as a state school.Having run this school for a time she moved on as the Principal of Pushpadana Balika Vidyalaya in KandyIn both these schools she is remembered with gratitude for the contribution she made for their progress.

Subsequently by early 1960s she went as a lecturer and Vice Principal of Polgolla Teachers Training College a prominent Lady Teachers College in the country.

On the personal side, by then she had married Mr.Herbert Siriwardena a Public Health Officer in Kandy in 1956 and was the happy mother of three children.

In 1966, on the strength of her achievements in the educational field she was selected as a lecturer at the Department of Education, Vidyodaya University of Ceylon (presently the Sri Jayawardenapura University).She lectured there in Educational Psychology and Educational Sociology for the next three years before proceeding to England on a University scholarship to pursue her post Graduate research at the University of London.

Being a conscientious and hard working scholar she completed this research obtaining the PhD. in Education from the Institute of Education in 1974.

On behalf of Lanka Viththi we wholeheartedly join in celebrating her reaching eighty years of age and wish her many more years of health happiness and strength to be with us and to continue the good work to which she has devoted herself so selflessly.

**May you live long!**

**- Venura**

1 වන පිටුවෙන්

## ශ්‍රීලංකාව-ඉන්දියාව හා ත්‍රස්තවාදය

නමුත් ඉන්දියාවේ කිසි ප්‍රතිපත්තියක් නැති දේශපාලනය සහ එහි වෙසෙන බංකොලොත් දේශපාලකයින් ගැන කිවහැක්කේ කුමක්ද?

විශාල රටක් නිසා ඉන්දියාවට විවිධ ජන කොටස්, විවිධ ආගම් අදහන්නන්, විවිධ භාෂාවල් කතාකරන්නන්, විවිධ කුලගෝත්‍රවලට අයත් වූවන් ආදී විවිධ පිරිස් විසින් දිනපතාම පාහේ ඇති කරනු ලබන විවිධ ප්‍රශ්න ගැටළු වල සීමාවක් නැත. ඉන්දියානු දේශපාලකයෝ එහි ජනතාවගේ ඉහතකී සියළු විවිධත්වයන් තමන්ට වාසි ඇතිවන විදියට අවශ්‍ය පරිදි හොඳින් හෝ නරකින් සකස්කරගන්නට දක්ෂයෝ වෙති. අනෙක් ආසන්න රටවලට කරදරයක් වෙන බව හොඳින් දන්නා නමුත් එය ඉන්දියාවට එතරම් කරදරයක් නොවේනම් ත්‍රස්තවාදය වුවද ඉවසා සිටීමේ ගතියක් ඉන්දියාවට ඇත. ඉන්දියාවේ බටහිරින් ජම්මු හා කාශ්මීරයද, නැගණහිරින් ඇසෑමයද ඉන්දියාවේ එම පිළිවෙතට මනා නිදසුන් වෙති. ලංකාවේ එල්ටීටීඊ සහ එවැනි ත්‍රස්තවාදී වෙනත් කල්ලි වලට ඉන්දියාව ආධාර කළේ තමිල්නාඩුවේ හිත සනසන්නටය. එය අපේ රටට කොපමණ හානි යක් වුනත් ඉන් තමන්ගේ කිසියම් අදහසක් ඉෂ්ට වෙනවා නම් ඉන්දියාව එවැන්නක් කරන්නට කිසිසේත් පසුබට නොවේ.

නමුත් මේ තත්වය සම්පූර්ණයෙන් ම කණපිට පෙරලෙන ක්‍රියාවලියක් ඉන්දියාවේ මුම්බායිහි ගිය මස සිදුවීය. ඒ ත්‍රස්ත ප්‍රහාරය ඉන්දියානුවන්ම සළකන්නේ ඇමරිකාවට සිදුවූ 9-11 වගේම ඉන්දියාවේ 9 -11 ලෙසටය. කරුණු මෙසේ හෙයින් අපේ පළහිලව් වලට අත නොදාන ලෙස අප දැන්වත් ඉන්දියානු රජයට කෙලින්ම කිව යුතුය. අනෙක් රටවලට කාරණා කියා දෙන්නට පෙර ඉන්දියාව තමන්ගේ රටේ කුණුකන්දල් සුද්ධකරගෙන සූදනන්ව සිටිය යුතු යයි ඔවුන්ට අවධාරණය කළ යුතුය. අපට නීති දාන්නට හෝ අප කළ යුත්තේ කුමක්දැයි අපට දැනමුතුකම් දෙන්නට හෝ ඔවුන්ට සදාචාරාත් මක අයිතියක් හෝ ජාත්‍යන්තර බලයක් හෝ නැති බව පැහැදිලිව ම මතක් කර දිය යුතු ය.

කරුණානිධි ඇතුළු තමිල්නාඩුවේ දෙමල දේසපාලුවන් හදිසියේ ලංකාවේ දෙමළ අය ගැන දැඩි සහෝදර කැක්කුමකින් කතාකරන්නේ අන් කිසිවක් නිසා නොව හෙට අනිද්දා ඉන්දියාවේ මහ ඡන්දයේදී ආසන දිනාගෙන බලයට ඒම පිණිසය. ඒ මිස කොටි ත්‍රස්තවාදීන් නිසා දුක් විඳින උතුරු-නැගණහිර වෙසෙන දෙමළ මිනිස්සු ගැන හෝ වෙනත් දෙමළ කොටසක් ගැන හෝ ආදරයකින් නොවේ. එසේත් නැත්නම් වේළුපිල්ලේගේ ආරක්ෂාව පතා ද විය හැකි ය.

### ජයග්‍රහණය ශක්තිමත් ලෙස තහවුරුකරගැන්ම

අපේ හමුදා හා පොලීසියේද සහෝදර පිරිස් කිසිදු ලාභාපේක්ෂාවකින් තොරව තම ශක්තිය, ධෛර්‍යය හා ආත්ම පරිත්‍යාගයෙන් යුතුව කළ කැපවීම්ද ඊට සැපයූ නායකත්වයන්ද නිසාම අද ජයග්‍රහණයේ විශාල දුරක් පැමිණ සිටිති. එය අප අගය කර රැකගතයුත වෙයි. එම ජයග්‍රහණයන් යළිත් ගිලිහී යා නොදී රැකගැන්මට දැඩි ලෙස සිතට ගැන්ම යෙහෙකි. මීට කලකට පෙර සටන්කර දිනාගත් ඇතැම් බිම් ආපසු සතුරා උදුරාගත්තේ ඒ නොසැලකිල්ල නිසාය. සතුරා යනු කොටියාම පමණක් නොවේ. නැවත මේ ජයග්‍රහණය බිම වැටෙන තුරු කල්මරමින් සිටින කොටි හිතවාදී ප්‍රතිගාමී කොටස් ඇත්තාහ. ඔවුන් සිවිල් අය විය හැක. ව්‍යාපාරිකයන් විය හැක. දේශපාලකයින් විය හැක. මේ සියළු බල-වේග හඳුනාගෙන සෙවිල්ලෙන් සිටිය යුතුවෙයි. එල්ටීටීඊ ක්‍රියාත්මක වන මාර්ග දැනට හමුදා-වෙන් වසා දමා ඇතත් ඔවුන් යළිත් උතුරු නැගණහිර සිවිල්වැසියන්ට සමීපවන්නට මාන බලනු ඇත. ඒ නිසා එම සිවිල්වැසියන්ගේ සිත් සතන් ඇද ගනිමින් ඔවුන්ගේ යහපත පිණිස කටයුතු කළ යුතුවෙයි.

රජය දැනටම මේ ගැන සිතා හරි ආකාරයෙන් උතුරු නැගණහිර සංවර්ධන වැඩ අරඹා තිබීම සුබදායක දෙයකි. නැගණහිර පළාත ත්‍රස්තවාදයෙන් මුදාගෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයකට යොමු කිරීම තුළින් රට සාර්ථක අංශයකට ගෙනයාමේ දී එහි වගකීම රඳා පවත්නේ නැගණහිර අළුතින් පත්වූ පළාත් සභාවට බව ඔවුන්ට මතක් කර දිය යුතුය. එල්ටීටීඊ ගෝලයන් මේ සියල්ල අවුල්කරන්නට උපරිම ලෙස වෑයම්කරනවා ඇත. ඒ ගැන දැඩි-සෙවිල්ලෙන් සිටිය යුතු වෙයි

ජයග්‍රහණය තහවුරුකරගැන්මට කිසිදු විරාමයක් නොබලා සියළු දෙනා තම උපරිම ශක්තිය මේ මොහොතේ සිටම යෙදවිය යුතු වන්නේය. දිනාගත් සියල්ල කිසිසේත් කිසි දිනක යළි ගිලිහී යන්නට ඉඩදිය යුතු නැත.